සැ. යු. - 2024.08.09 දින පළ කරන ලද අංක 2397 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,398 - 2024 අගෝස්තු මස 16 වැනි සිකුරාදා - 2024.08.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 738 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 සැප්තැම්බර් මස 06 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 අගෝස්තු මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


737 - B 082599 — 5,403 (2024/08)
F 1 -

# පළාත් සභා නිවේදන

## මධ්‍යම පළාත් සභාව

### මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් කරන ලද නිවේදනයයි

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 10 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ බලතල පැවරීම**

මධ්‍යම පළාත් සභාවේ ආණ්ඩුකාරවර ලලිත් යූ. ගමගේ වන මා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල අනුව, මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 10 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 2(2), 2(4) උපවගන්ති අනුව පහත අංක I වැනි තීරුවේ නම සඳහන් මධ්‍යම පළාත් සභාවේ සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් (ශ්‍රී ලංකා පරිපාලන සේවය) වෙත III වැනි තීරුවේ සඳහන් බලතල II වැනි තීරුවේ සඳහන් දින සිට ක්‍රියාත්මක වන පරිදි පවරා දෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| සඳමාලි හේවගේ මිය | 2024.06.19 | මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 10 දරන මධ්‍යම පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියෙන් අංක 3, 5, 6, 7, 8, 9, 33, 43, 43අ, 44, 45, 46, 48, 52, 53, 54, 58, (2අ, 3,4,5 උපවගන්ති හැර) 59, 60අ, 66, 67, 68, 69 74, 75 සහ 1973 සමුපකාර සමිති රීති මාලාවේ අංක 4, 11, 15, 16(II), 18, 19, 20, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 43, 48, 49, (12 ආ, ඇ, ඈ, ඉ උපවගන්ති හැර) 51, 52, 53 යන රීති යටතේ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් සතු බලතල. |

නීතිඥ ලලිත් යූ. ගමගේ,
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

08-118